# ආර්ථික පසුබිම

දිස්ත්‍රික්කයේ කෘෂිකාර්මික කටයුතු අතර වී, පොල්, රබර් යන ප්‍රධාන භෝග වගාකරනු ලැබේ. වර්ෂයේ වැඩි කාලයක් ඇදහැලෙන අධික වර්ෂාපතනය හේතුවෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළ ආහාර භෝග වගාවන්ට අමතරව ආර්ථික භෝග වෙත නැඹුරු වී තිබේ. අනිකුත් කෘෂිකාර්මික භෝග යටතේ එළවළු, පළතුරු, සුළු අපනයන හා වෙනත් භෝග අයත් වේ.

කාලීන භෝග අතර මඤ්ඤොක්කා, වම්බටු, බතල, පලා වර්ග, අළු කෙසෙල්, කරවිල, බණ්ඩක්කා, වෙනත් අල හා මිරිස්, මෑ යන භෝගයන් ද, ස්ථිර හා අර්ධ ස්ථිර භෝග අතර, කෙසෙල්, අඹ, අන්නාසි, රඹුටන්, පැපොල්, පළතුරු අනුපිළිවෙලින් ප්‍රධාන තැනක් ගනි. සුළු අපනයන භෝග වශයෙන් කෝපි, ගම්මිරිස්, කරාබු, කුරුඳු හා වෙනත් භෝග හා කොස්, කජු, පුවක්, බුලත්, දෙල්, ඉඟුරු, කහ යන භෝගයන් වැදගත් වෙයි. දිස්ත්‍රික්කයේ මුළු ඉඩම් ප්‍රමාණයෙන් 57 % ක් ප්‍රයෝජනයට ගැනෙන්නේ පදිංචි නිවාස හා ඒ අවට ඇති ගෙවතු වශයෙනි. දිස්ත්‍රික්කයේ මීගමුව, වත්තල කොට්ඨාස ආශ්‍රිතව ධීවර කර්මාන්තය දක්නට ලැබෙන අතර කරදිය ධීවර කටයුතු වලින් 80% මීගමුව කොට්ඨාසයේ කේන්ද්‍රගතව තිබීම විශේෂ ලක්ෂණයකි.

ආර්ථික ව්‍යුහය තුළ පසුකාලීන දත්ත අධ්‍යනයේ දි සැළකියයුතු පරිවර්තනයක් සිදු වී තිබේ. කර්මාන්ත හා සේවා අංශයන්හි නිමවුමේ හා සේවා නියුක්තියේ සීඝ්‍ර වර්ධනයක් පෙන්වයි. 1962 දී ඒකල පිහිටුවන ලද කර්මාන්ත සංකීර්ණය ශ්‍රී ලංකාවේ කර්මාන්ත යුගයක මූලාරම්භය බව පෙන්වා දිය හැකිය. 1977 පසු නිදහස් වෙළඳ කලාපීය ක්‍රමය ප්‍රකාශයට පත් කෙරුණි. බියගම, මීරිගම හා කටුනායක ආශ්‍රිතව කර්මාන්ත ත්‍රිකෝණයක් ගම්පහ දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශ තුළ ඇති කිරිම කර්මාන්ත ක්ෂේත්‍රයේ දි නවෝදයක් බිහිවීමට මඟ පෑදුණි.

කොළඹ සිට කි.මී. 29 දුරින් කටුනායක අපනයන සැකසුම් කලාපය පිහිටා තිබේ. 1978 කටුනායක ආශ්‍රිත ප්‍රදේශයේ ශ්‍රී ලංකාවේ ප්‍රථම නිදහස් වෙළඳ කලාපය ආරම්භ වීමත් සමඟ ප්‍රාග්ධන සූක්ෂම හා තාක්ෂණ සූක්ෂම ඇති වෙතැයි අපේක්ෂා කළ ද, නිදහස් වෙළඳ කලාපය තුළ ශ්‍රම සූක්ෂම කර්මාන්ත අති බහුතරයක් ස්ථානගත වී තිබේ. 1985 දී බියගම නිදහස් වෙළඳ කලාපය ආරම්භ වූ අතර එය කොළඹ සිට කි.මී. 24 ක් දුරින් අක්කර 450 ක් තරම් වූ භූමි ප්රමාණයක ව්‍යාප්ත ව තිබේ.

1992 මහ කොළඹ ආර්ථික කොමිෂම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වශයෙන් නම් කර වෙළඳ කලාප වල ව්‍යවසායකයන්ට වැඩි පහසුකම් ලබා දීමත් සමඟ උප කොන්ත්‍රාත් පදනම යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් කඳාන, වත්තල, ජා ඇල යන උප නාගරික කොට්ඨාසවලට ව්‍යාප්ත විය.

1994 දී මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය ඇරඹුණි. ඒ අත්තනගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ මහනුවර කොළඹ ප්‍රධාන මාර්ගයේ තිහාරියත් නිට්ටඹුවත් අතර පිහිටා ඇති අක්කර 50 ක භූමියක් පුරා ව්‍යාප්තව ඇත. 1998 මීරිගම ප්‍රදේශයේ ද කර්මාන්ත ශාලා ආරම්භ වී තිබේ. මේ මඟින් නිර්මාණය වී ඇති ශ්‍රම බලකාය කෙටිකාලින සංක්‍රමණ ප්‍රජාවක් ලෙසත්, ජාතික ශ්‍රම බලකායේ නව ස්ථරයක් ලෙසත් හඳුන්වා දිය හැකිය.

**වේවැල් ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනය**

මෙලෙස දියුණුකළ හැකි කර්මාන්ත අතර මීරිගම ප්‍රා.ලේ. කොට්ඨාසයේ රදාවඩුන්න ප්‍රදේශය ආශ්‍රිත වේවැල් කර්මාන්තය අවධානයට යොමුවිය යුතුය. කර්මාන්ත කරුවන් හා සේවකයින් සිය ගණනකගේ දිගු කාලයක් තිස්සේ ජීවනෝපාය මාර්ගයක් ලෙස පවතින මෙම කර්මාන්තය අමුද්‍රව්‍ය හිගකම, ආනයනය කරනු ලබන වේවැල් ආනයන කරුවන් කීපදෙනකු අත රැදි තිබීම, ප්ලාස්ටික් නිෂ්පාදන සමග තරඟ කිරීමට සිදුවීම වැනි ගැටළු වලට මුහුණ දී තිබුනද දිගුකාලයක් තිස්සේ නොවෙනස්ව ඉල්ලුමක් පවතින කර්මාන්තයකි. විශේෂයෙන් සංචාරකයින්ගේ හා දේශිය ජනතාවගේ ඉහළ ඉල්ලුමක් හා ප්‍රසාදයක් දිනාගෙන ඇති කර්මාන්තයකි.

**අත්කම් ස්වර්ණාභරණ නිෂ්පාදනය**

බියගම කොට්ඨාසයේ සියඹලාපිටිය, හෙයියන්තුඩුව, මාවරමංඩිය ප්‍රදේශවල ද මහර කොට්ඨාසයේ ඇඹරළුව, වැබඩ ප්‍රදේශවලද දොම්පෙ කොට්ඨාසයේ මැද්දෙගම, රුවන්මාවත ප්‍රදේශවලද අත්තනගල්ල කොට්ඨාසයේ බෝපැත්ත, තිරිවානේගම ප්‍රදේශවල ද මිනුවන්ගොඩ කොට්ඨාසයේ ගල්ඔළුව ආශ්‍රිතව දිස්ත්‍රික්කයේ විසුරුණ කර්මාන්තයක් ලෙසත්, පවුල් සිය ගණනකගේ ජීවනෝපාය මාර්ගයක් ලෙසත් අත්කම් ස්වර්ණාභරණ කර්මාන්තය ක්‍රියාත්මක වේ. සිංගප්පූරු වෙළඳපොලේ ස්වර්ණාභරණ නිෂ්පාදිත ශ්‍රී ලංකාවට ගෙන ඒම මෙම කර්මාන්ත කරුවන් මුහුණ දෙන ප්‍රධාන ගැටළුවකි. එම බාධකයන්ට මුහුණ දෙමින් නිදහස් වෙළඳ කලාපය සේවිකාවන්ගේ ඉල්ලුම සැපයීමට ස්වර්ණාභරණ කර්මාන්ත කරුවන් සමත්වී තිබේ.

**පිත්තල වාත්තු කර්මාන්තය**

දේශිය ගොඩනැගිලි ඉදි කිරිම් ක්ෂේත්‍රයේ දොර ජනෙල් සවි කිරිම සඳහා යොදා ගන්නා පිත්තල භාණ්ඩ ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රදේශ කීපයක නිෂ්පාදනය වේ. සරනේරු, සීනු, හුලං කොකු වැනි ප්‍රමාණයෙන් කුඩා භාණ්ඩ ඒ අතර වෙයි. මීට අමතරව ගාංධාර වැනි ප්‍රමාණයෙන් විශාල භාණ්ඩද දිස්ත්‍රික්කයේ ප්‍රදේශ කීපයක නිෂ්පාදනය වෙයි. මහර ප්‍රා.ලේ කොට්ඨාසයේ දළුපිටිය, වරහන්තුඩුව, මහර පාදිලියාතුඩුව, කිරිමැටියාගාර, ඊරියවැටිය, එබේරමුල්ල ප්‍රදේශවලද, හීන්කන්ද, ගුරුතලාව වැනි වත්තල කොට්ඨාසයේද කැලණිය කොට්ඨාසයේ දළුගම කෙහොල්විල ප්‍රදේශ ආශ්‍රිතව ද කර්මාන්ත කරුවන් සිය ගණනක හා කුලී පදනම මත පුහුණු වැඩ කරුවන් දහස් ගණනක ජීවනෝපාය බවටද මෙම කර්මාන්තය පත්ව තිබේ.

**ලුහු ඉංජිනේරු කර්මාන්තය**

ජන ජීවිතයට එදිනෙදා අවශ්‍ය භාණ්ඩ ගමේම කම්මලෙන් සාදා ගැනිම ඉතා දිගු කලක් තිස්සේ දක්නට ලැබෙන කර්මාන්තයකි. මෙම කර්මාන්තය විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා ටෙලිකොම් වැනි ආයතනවලට ඇණවුම් සැපයීමට තරම් විධිමත් තත්වයකට දියුණු කිරිමට ගම්පහ දිස්ත්‍රික්කයේ කර්මාන්ත කරුවන් සමත්ව තිබේ. කැති, උදළු, මන්න හා වැද්දුම් සඳහා යොදා ගන්නා ඇණ, මුරුච්චි වැනි භාණ්ඩ මහර ප්‍රා.ලේ.කොට්ඨාසයේ වැබඩ, ඇඹරළුව, අත්තනගල්ල කොට්ඨාසයේ ඕගොඩපොළ ගම්පහ ප්‍රා.ලේ. කොට්ඨාසයේ

ඉඹුල්ගොඩ, වැලිවේරිය ප්‍රදේශවල දක්නට පුළුවන .මීට අමතර ප්‍රාදේශියව ඒකරාශීව සම්ප්‍රදායිකව පවත්වාගෙන යනු ලබන කර්මාන්ත රාශියක් දිස්ත්‍රික්කය පුරා දක්නට ලැබේ. පන් ආශ්‍රිත භාණ්ඩ නිපදවන කාර්මික ශිල්පීය ඥාණය පාරම්පරිකව උරුමකර ගත් පිරිස් සීදුව, දඹදූරේ ගම්මානයේ දක්නට පුළුවන. කටාන ප්‍රා.ලේ.කොට්ඨාසයට අයත් කිඹුලපිටිය, අකරගම, ගොඩිගමුව ප්‍රදේශවල ගෘහ ආශ්‍රිතව රතිඤ්ඤා කර්මාන්තය බහුලව දක්නට ලැබේ. මිනුවන්ගොඩ කොට්ඨාසයේ හීනටියන ප්‍රදේශයේ කොහු ආශ්‍රිත භාණ්ඩ නිෂ්පාදනයේ නිරත පවුල් විශාල වශයෙන් දක්නට ඇත. අනාදිමත් කාලයක් තිස්සේ උළු ගඩොල් කර්මාන්තයට කොච්චිකඩේ ප්‍රදේශය ප්‍රසිද්ධියක් දරයි. ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම කොට්ඨාසයේ බටලීය කජු සම්බන්ධ ව සුප්‍රසිද්ධය. වාරියපොල, පුත්තලම ප්‍රදේශවලින් ගෙනවිත් බටලීය නැදගමුව ප්‍රදේශ ආශ්‍රිතව සකස්කර විකිණීමෙන් ජීවිතය පවත්වාගෙන යනු ලබන පවුල් සිය ගණනකි.

හුණු කර්මාන්තය රතුපස්වල, බැලුම්මහර ප්‍රදේශවලත් අන්නාසි වෙළදාම බැලුම්මහර, ඉඹුල්ගොඩ ප්‍රදේශවලත් දක්නට ලැබේ. රඹුටන් වගාව හා බුලත් වගාව බහුලව දක්නට ලැබෙන අතර දිස්ත්‍රික්කය පුරා විසිරුණු විසිතුරු මල් වගාව, පැල තවාන් හා විකුණන ස්ථාන දක්නට ලැබේ.

## Economic Background

Paddy, Coconut and Rubber are the main crops cultivated in the field of agriculture in the district. Due to the heavy rain received throughout the year, Gampha district has a tendancy to grow economic crops apart from the food crops. Vegetables, fruits, minor exports and other crops fall under other agricultural crops. Manioc, Brinjal, Sweet Potatoes, Leaves, Ash plantain, Bitter Gourd, Ladies fingers, other types of Yames, Chillie and Long Beans fall under seasonal crops and the fruits, Plantains, Mangoes, Pineapples, Rambutan, Papaya are considered as permanent or semipermanent crops. Coffe, Pepper, Cloves, Cinnamon and other crops and Jack Cashew, Arecanut, Betel, Bread Fruit, Ginger and Turmeric are important as minor exports crops. Fifty seven percent of the entire landscape belonging to the district is used for residences and nearby gardens. Fishery is seen in associate with Negambo and Wattala divisions in the district and it is a special characteristic that 80% of the seawater fishery is centered on Negambo division.

When considering the post peiod data a considerable transformation has, taken place with in the economic structure. A rapid development is visible in the productivity of industry and services and in the employment. Establishing the industrial complex in Ekala in year 1962 can be sited as the beginning of an industrial era in sri lanka. The system of free trade zone was introduced after 1977. The establishment of an industrial triangle connecting Biyagama, Mirigama and Katunayaka within Gampaha paved the way for a new beginning in the field of industry.

Katunayaka export processing zone is located 29 km away from Colombo. Though it was expected that microcapital or microtechnology will arise with the commencement of first free trade zone in Sri Lanka in the areas associated with Katunayaka in 1978, a number of micro labour industries are located within the free trade zone itself. Biyagama free trade zone began in year 1985. It is spread around 450 acres about 24 km away from Colombo.

With granting of higher facilities to entrepreneurs in the zones named as Sri lanka Investment Board by the central Colombo economics commission in 1992, Minor and middle scale entrepreneurs spread arround Kadana, Wattala and Ja- Ela based on sub contract basis.

Malwatta Export Processing Garden began in year 1994. It is spread arround a land of about 50 acres located between Thihariya and Nittambuwa along Colombo Kandy main road in Attanagalla divisional secretariat. Factories have been opened in Mirigama area as well in 1998. The labour force created with this can be acquainted as a short-term transit community and as a new stratum of the work force.

## Cane product

Attention should be focused on cane industry in Radawaddunna area in Mirigama divisional secretariat as an industry that can be developed. Though cane industry, which has been the livelihood of industrialist and hundreds of workers for a long time had to face many difficulties due to lack of raw materials, due to the authority of exporting of cane items remaining in several exporters it is an industry for which there had been an unchangeing demand cver a long period of time. It is an industry, which has won a higher demand and gratification as a qualitative product specialy for tourist.

## Handicraft jewelery products

Handicraft jewelery industry is spread around Siyambalapitiya, Heiyanthuduwa and Mawaramandiya areas in Biyagama division, in Embaraluwa, Webada Mahara division Meddegama, Ruwanmawattha in dompe Bopattha, Thiriwanegama in Attanagalla, Galoluwa in Minuwangoda division is the livelihood of hundruds of people in these areas. The major problem faced by the people involved in this industry is how to get jwelery products in the Singapore market to Sri Lanka. Facing said obstruction, the people involved in the jewelery industry have been successful to supply the demand of the employees in the free trade zones.

## Brass industry

Brass product required to fix doors and windows in the building construction industry are produced in several areas in Gampaha district. There are smaller items such as hinges, bells, wind hooks amongst them. Apart from these larger items such

as bells are produced in several areas in the district. This is an industry of hundreds of enterpreneurs and is the livelihood of thousands of hired trained workers in Dalupitiya, Warahanthuduwa, Mahara, padiliyathuduwa, Kirimatiyagara and Enderamulla areas in Mahara divisional secretariat and Heenkenda and Guruthalawa in Wattala division and Dalugama and Koholwila areas Kelaniya Division.

## Engineering Industry

Making the tools required for daily life through a smithy had been an industry there had been for a long time. In entrepreneurs in Gampaha district has been able to develop this industry in to a formal status where they can supply orders of institutions making institutions like the electricity board and Sri Lanka telecom, their market. Production of catty, mammoty and nails and nuts used for welding are seen in Webada and Embaraluwa in Mahara division, in Ogodapola in Attanagalla division and Imbulgoda and Weliweriya areas in Gampaha divisional secretariat. Apart from many industries, which are, traditionaly conducted can be seen all over the district. The inherited traditional technologies of craft related to Reeds are visible in the villages Seeduwa, Dambadure. The industry of firecrackers is numerously seen in the areas Kimbulapitiya, Akaragama and Godigamuwa in Katana divisional secretariat. Many families involved in producing Coir related product are seen in Henatiya area in Minuwangoda division. Kochchikade area has been popular for bricks industry since long time ago. Bataleeya in Mirigama division in Gampaha district is famous for cashew. There are hundreds of families who support their lives by selling product related to cashew in the areas Bataleeya and Nedagamuwa, which they make from the cashew they bring from Wariyapola and Puttalam.

Limestone industry is famous in Rathupaswala and Belummahara area and Pineapple trade is seen in Belummahara and Imbulgoda. Rambutan and Beetle cultivation is mainly seen in these areas and floriculture, nursaries and stalles are seen throughout the district.